# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1878/12 - 2014 සැප්තැම්බර් මස 01 වැනි සඳුදා - 2014.09.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමග කියවිය යුතු එම පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2014 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2014 අංක 1 දරන මහ මුහුදේ ධීවර මෙහෙයුම් නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ප්‍රදානය කරන ලද වලංගු බලපත්‍රයක අධිකාරී බලය යටතේ හැර කිසිදු තැනැත්තකු විසින් මහ මුහුදේ දී මෙහි I වන උප ලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති කිසිදු ධීවර මෙහෙයුමක නොයෙදිය යුතුය.

3. (1) 2 වන නියෝගයේ සඳහන් කරන ලද මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා වන බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් ම මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති අදාළ බලපත්‍ර ගාස්තු සමග අධ්‍යක්ෂ - ජනරාල්වරයා වෙත භාරදෙනු ලැබිය යුතුය.

(2) 2 වන නියෝගය යටතේ ප්‍රදානය කරන සෑම බලපත්‍රයක්ම මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර කලින් අත්හිටුවා හෝ අවලංගු කර ඇත්නම් මිස ඒ බලපත්‍රය ප්‍රදානය කරන ලද දින සිට එක් ලිත් වර්ෂයක කාල සීමාවක් සඳහා වලංගු විය යුතුය.

(3) 2 වන නියෝගය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් දරන්නා විසින්, බලපත්‍රය කල් ඉකුත් වන දිනයට පෙරාතුව දින තිහකට නොඅඩු කාලසීමාවක දී ඒ බලපත්‍රය අලුත් කිරීම සඳහා මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති අදාළ බලපත්‍ර ගාස්තු සමඟ අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකිය.

4. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදු කිරීම සඳහා ප්‍රදානය කරන ලද බලපත්‍රය දරන්නා විසින් 1982 දෙසැම්බර් මස 10 වන දින එක්සත් ජාතීන්ගේ සාගර නීති සම්මුතිය, 1995 එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය තොග පිළිබඳ ගිවිසුම සහ ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභා ගිවිසුම සහ 2009 නීති විරෝධී වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැලැක්වීමට, නතර කිරීමට සහ පිටු දැකීමට වරාය සහිත රාජ්‍යයන්වල පියවර පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධාන ගිවිසුම් අනුව පිළිගත් සංරක්ෂණ සහ කළමනාකරණ පියවරවල් යටතේ මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පනවන ලද පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතු ය :-

(i) ධීවර බෝට්ටු නියමුවා/ප්‍රධානියා විසින් බෝට්ටුවේ ලියාපදිංචි සහතිකය සහ බෝට්ටු නියමු බලපත්‍රය හෝ එහි සහතික කළ පිටපතක් සමග මහ මුහුදේ ධීවර කටයුතු සඳහා වන මෙහෙයුම් බලපත්‍රය සියළු අවස්ථාවන්හි දී බෝට්ටුවේ රැගෙන යා යුතු අතර බලයලත් නිලධාරියකු ඉල්ලා සිටින අවස්ථාවක දී ඒ බලපත්‍රය, බෝට්ටුවේ ලියාපදිංචි සහතිකය සහ බෝට්ටුවේ නියමු සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

(ii) මෙම නියෝග යටතේ නිකුත් කළ බලපත්‍රයක අධිකාරී බලය යටතේ හැර මහ මුහුදේ කිසිදු කොටසක ධීවර කටයුතු සිදු කිරීමට අවසර දෙනු නොලැබිය යුතු ය.

(iii) බෝට්ටුව ශ්‍රී ලංකා ධජය යටතේ යාත්‍රා කළ යුතු අතර, රටේ නම (ධජ රාජ්‍යය) හා බෝට්ටුවේ ලියාපදිංචි අංකය බෝට්ටුවේ බඳේ දෙපස පැහැදිලිව ප්‍රදර්ශනය කළ යුතු ය. හඳුනා ගැනීමේ සලකුණු 1980 ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීම පිළිබඳ නියෝග සහ යම් ධීවර බෝට්ටුවක් සලකුණු කිරීම හා හඳුනා ගැනීම සඳහා වන ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ පිළිගත් නියමයන්/පිරිවිතරයන් වලට අනුකූලව ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(iv) ධීවර බෝට්ටු නියමුවා/ප්‍රධානියා විසින් බෝට්ටුව ධීවර වරායෙන් පිටවීමට පෙරාතුව සහ ඒ වරායට ඇතුල් වූ විගස වරාය කළමනාකරු වෙත වාර්තා කළ යුතු ය.

(v) යම් ධීවර බෝට්ටු නියමුවකු/ප්‍රධානියකු විසින් මෙම නියෝග යටතේ මෙහෙයුම් බලපත්‍රයක් ප්‍රදානය කරන ලද යම් ධීවර බෝට්ටුවක්, වෙනත් වෙරළාසන්න රාජ්‍යයක ඔවුන්ගේ දේශීය ජල තීරයේ ඒ රාජ්‍යයේ නීතිවලට අනුකූලව එසේ කිරීමට බලය දී ඇත්නම් මිස ධීවර මෙහෙයුම් සඳහා භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

(vi) මුහුදු ක්ෂීරපායින්, කැස්බෑවන්, කසමෝරා විශේෂයන් හෝ මුහුදු පක්ෂීන් වැනි තහනම් කරන ලද මත්ස්‍ය විශේෂ සහ ලේබල් කරන ලද සත්ව විශේෂයන් ඇල්ලීම, ගොඩබෑම, ප්‍රවාහනය කිරීම, වෙනත් බෝට්ටුවකට මාරු කිරීම, ලබා ගැනීම හෝ සන්තකයේ තබා ගැනීම, බෝට්ටුව මගින් සිදු නොකළ යුතු ය.

(vii) ධීවර බෝට්ටු නියමුවා/ප්‍රධානියා විසින් සෑම විටම යාවත්කාලීන කරන ලද ලොග් සටහන් පොතක් තමන් සන්තකයේ පවත්වාගෙන යා යුතු ය.

(viii) (vii) වන ඡේදය යටතේ පවත්වාගෙන යන ලොග් සටහන් පොතේ ඇතුළත් කරන තොරතුරු නිවැරදි, සම්පූර්ණ සහ සත්‍ය බවට බෝට්ටු නියමුවා/ප්‍රධානියා විසින් සහතික කරනු ලැබිය යුතු අතර ධීවර වරායට ළඟා වීමේදී අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ වෙනත් යම් බලයලත් නිලධරයකු විසින් නම් කළ නිලධරයකුට ලොග් සටහන් පොතේ අදාළ පිටුවේ මුල් පිටපත භාර දෙනු ලැබිය යුතු ය.

(ix) කරමල් දැල් භාවිතා කරමින් මහ මුහුදේ ධීවර මෙහෙයුම් පවත්වාගෙන යන අවස්ථාවක දී ඒ කරමල් දැලේ උපරිම දිග කිලෝමීටර දෙකයි දශම පහකට අඩු විය යුතු ය.

(x) කිසිදු බෝට්ටු නියමුවකු/ප්‍රධානියකු විසින් මහ මුහුදේ සවිකරන ලද දත්ත බෝයාවලින් නාවික සැතපුම් එකක අරය තුළ පිහිටා ඇති ප්‍රදේශවල ධීවර මෙහෙයුම් නොකළ යුතු අතර ඒ දත්ත බෝයාවලට අලාභහානි නොකළ යුතු ය.

(xi) කිසිදු බෝට්ටු නියමුවකු/ප්‍රධානියකු විසින් ඉන්දියන් සාගරයේ කණ්ඩාංක උතුර $0^0$ - $10^0$ සහ නැගෙනහිර $40^0$ - $60^0$ දක්වා ඇති ප්‍රදේශවල සහ වෙනත් ආරක්ෂිත ප්‍රදේශවල මරුවැල් භාවිතා කරමින් පෙබරවාරි මාසය තුළ දී ද හැඹිලි දැල් ද භාවිතා කරමින් සැප්තැම්බර් මාසය තුළ ද ධීවර මෙහෙයුම් සිදු නොකළ යුතු ය.

(xii) (අ) හැඹිලි දැල් බෝට්ටු වලින් මුහුදින් අල්ලා ගෙන එනු ලබන සියලු ඇස්ගෙඩි කෙලවල්ලා, බලයා සහ කහ කෙඳි කෙලවල්ලා, මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු මත්ස්‍යයින් හැර බෝට්ටුවේ තබා ගෙන ගොඩ බානු ලැබිය යුතු ය.

(ආ) මසුන් ගබඩා කිරීමට ප්‍රමාණවත් ඉඩක් නොමැති බවට බෝට්ටු නියමුවා/ප්‍රධානියා විසින් දත් අවස්ථාවක දී පහත සඳහන් පියවර වලින් එකක් ගනු ලැබිය යුතු ය :-

(i) හැකි ඉක්මනින් කෙලවල්ලා මසුන් (ඇස්ගෙඩි කෙලවල්ලා, බලයා සහ කහ කෙදි කෙලවල්ලා) පණ පිටින් මුදා හැරීමට ඔහු විසින් පියවර ගනු ලැබිය යුතුය ; සහ

(ii) කෙලවල්ලා මසුන් (ඇස් ගෙඩි කෙලවල්ලා සහ කහ කෙදි කෙලවල්ලා) ඉවත් කළ පසු බෝට්ටුව වරායට ළඟාවන තුරු ඔහු විසින් මසුන් ඇල්ලීම නොකළ යුතු ය.

(ඇ) කිසිඳු බෝට්ටු නියමුවකු/ප්‍රධානියකු විසින් හිතාමතා ම සිටේසියන් ගෝත්‍රයට අයත් මිණි මුතු මෝරුන් සඳහා හැඹිලි දැල් එලීම නොකළ යුතු ය.

5. 2 වන නියෝගය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කළ යම් තැනැත්තෙකුට වෙනත් යම් රටක යම් වරායක් තුළ දී මසුන් ගොඩබෑමට හෝ මසුන් වෙනත් බෝට්ටුවකට මාරු කිරීමට අවසර දෙනු නොලැබිය යුතු ය.

6. මෙම නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කළ ධීවර සහ ජලජ සම්පත් පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

"බලපත්‍රය දරන්නා" යන්නට බලපත්‍රය දරන්නාගේ හෝ බෝට්ටුව අයිතිකරුගේ අනුයෝජිතයකු හෝ සේවකයකු ඇතුළත් වේ.

**2 වන නියෝගය**

**I වන උපලේඛනය**

***මහ මුහුදේ නියම කරන ලද ධීවර මෙහෙයුම්***

1. හැඹිලි දැල් භාවිතයෙන් ධීවර මෙහෙයුම්
2. මරුවැල් භාවිතයෙන් ධීවර මෙහෙයුම්
3. කරමල් දැල් සහ මරුවැල් භාවිතයෙන් ධීවර මෙහෙයුම්
4. කරමල් දැල් භාවිතයෙන් ධීවර මෙහෙයුම්
5. බලපිති පන්නය භාවිතයෙන් ධීවර මෙහෙයුම්
6. අත් යොත් පන්නය භාවිතයෙන් ධීවර මෙහෙයුම්
7. ට්‍රෝලර් - දුවන පන්නය

ශ්‍රී ලංකා රජය විසින් අනුමත කළ/එකග වූ ජාත්‍යන්තර ගිවිසුම්/කලාපීය සම්මුති/යෝජනා සම්මුති වලදී ධීවර කර්මාන්තයේ සංවර්ධනය සඳහා හඳුන්වාදෙන වෙනත් යම් ධීවර ආම්පන්න.

**3(1) වන නියෝගය**

**II වන උපලේඛනය**

***ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව***

මහ මුහුදේ ධීවර මෙහෙයුම් බලපත්‍රය සඳහා වන ඉල්ලුම් පත්‍රය

1. අයිතිකරු පිළිබඳ විස්තර

(අ) අයිතිකරුගේ සම්පූර්ණ නම : ————— ;

(ආ) අයිතිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය : ————— ;

(ඇ) අයිතිකරුගේ ස්ථිර ලිපිනය : ————— ;

(ඈ) තැපැල් ලිපිනය : ————— ;

(ඉ) දුරකථන අංකය : ————— ;

(ඊ) විද්‍යුත් තැපෑල : ————— ;

2. ප්‍රධානියා/නියමුවා පිළිබඳ විස්තර

(අ) ප්‍රධානියා/නියමුවාගේ නම, ලිපිනය, දුරකථන අංකය සහ ජාතික හැඳුනුම්පතේ අංකය : ————— ;
______________________________________________

(ආ) නියමුවාගේ බලපත්‍ර අංකය හා දිනය : ————— ;

3. බෝට්ටුව පිළිබඳ විස්තර

(අ) බෝට්ටුවේ ලියාපදිංචි අංකය : ————— ; මුල් ලියාපදිංචි කළ දිනය : ————— ;
නැවත අලුත් කළ යුතු දිනය : ————— ;

(ආ) බෝට්ටුවේ නම (තිබේ නම්) : ————— ;

(ඇ) අන්තර් ජාතික ගුවන් විදුලි සන්නිවේදන අංකය : ————— ;

(ඈ) ලියාපදිංචි වරාය : ————— ;

(ඉ) බෝට්ටුවේ පෙර ධජ (තිබේ නම්) : ————— ;

(ඊ) බෝට්ටුව සාදනු ලැබූ මුල් රට සහ සාදනු ලැබූ වර්ෂය : ————— ;

(උ) බෝට්ටුවේ වර්ගය : ————— ;

(ඌ) බෝට්ටුවේ බඳ සඳහා යොදා ගනු ලැබූ ද්‍රව්‍ය : ————— ;

(එ) දළ පැටවුම් බර : ————— ;

(ඒ) සම්පූර්ණ දිග : ————— ;

(ඔ) එන්ජින් වර්ගය : ————— ;

(ඕ) එන්ජින් අංකය : ————— ;

(ක) ප්‍රධාන එන්ජිමේ බලය/බෝට්ටුවේ ඇති එන්ජින් : ————— ;

4. ධීවර ආම්පන්න පිළිබඳ විස්තර/ධීවර මෙහෙයුම් සඳහා යොදා ගනු ලබන ක්‍රම

(අ) කරමල් දැල් (දැල කි.මී. 2.5 කට වඩා දිගින් අඩු විය යුතු ය.)

| මුළු දිග | ගැඹුර | දැල් ඇස් ප්‍රමාණය/වෙළුව | ඉලක්කගත මසුන් වර්ග |
|---|---|---|---|
| | | | |
| | | | |

(ආ) මරු වැල්

| සම්පූර්ණ බිලී කොකු ගණන | ඒකක ගණන | ඉලක්කගත මසුන් වර්ග |
|---|---|---|
| | | |

(ඇ) පර්ස්සින්/හැඹිලි දැල්

| දැලේ දිග | දැලේ ගැඹුර | දැල භාවිතා කරනු ලබන්නේ නිදහසේ පිහිනන මසුන් රැනකටද/ මත්ස්‍ය ඒකරාශී කාරක ඇටවුමක ද (පාවෙන හෝ සවි කරන ලද) | ඉලක්කගත මසුන් වර්ග |
|---|---|---|---|
| | | | |

(ඈ) භාවිතා කරනු ලබන වෙනත් ආම්පන්න

| | | |
|---|---|---|
| | | |

ඉහත ප්‍රකාශයේ සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනුමට අනුව සත්‍ය හා නිවැරදි බව මෙයින් තහවුරු කරමි.

මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍රයක් මා වෙත නිකුත් කරනු ලැබූ විට, 2013 අංක 35 දරන පනතින් සංශෝධිත පරිදි 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ 2014 අංක 1 දරන මහ මුහුදේ ධීවර මෙහෙයුම් නියෝගවලට අනුකූලව සහ 1982 එක්සත් ජාතීන්ගේ සාගර නීති සම්මුතිය, 1995 එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය තොග ගිවිසුම සහ ඉන්දියන් සාගර ටූනා කොමිෂන් ගිවිසුම, 2009 නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැලැක්වීමට, නතර කිරීමට සහ පිටු දැකීමට වරාය සහිත රාජ්‍යවල පියවර පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධාන (FAO) ගිවිසුම යටතේ පිළිගත් සංරක්ෂණ සහ කළමනාකරණ පියවරවල් වලට අනුකූලව ධීවර මෙහෙයුම් බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වෙමි.

.............................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ................................

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

(අ) ධීවර පරීක්ෂකගේ නිරීක්ෂණ/නිර්දේශ

ගෙවන ලද මුදල රු. ගෙවීම් කරන ලද දිනය : ......................................

රිසිට් පත් අංකය : ......................................

(ආ) මහ මුහුදේ ධීවර මෙහෙයුම් බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි./නොකරමි.
.............................................................................................................................

| ............................................. | ....................................................... | ....................................................... | .................................... |
|---|---|---|---|
| අත්සන | ධීවර පරීක්ෂකගේ නම | ධීවර පරීක්ෂක කොට්ඨාශය | දිනය |

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්/සහකාර අධ්‍යක්ෂ/බලපත්‍රදීමේ නිලධාරියාගේ නියෝගය

මහ මුහුදේ ධීවර මෙහෙයුම් බලපත්‍රයක් නිකුත් කිරීම අනුමත කරමි./නොකරමි.

1. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා යොදා ගනු ලබන බෝට්ටුවේ නම : ........................................................
ලියාපදිංචි අංකය : ........................................................

2. බලපත්‍රය සඳහා අනුමත ධීවර ආම්පන්න

| ධීවර ආම්පන්න වර්ග | දැල් දිග සහ ගැඹුර/දැල් ඇස් ප්‍රමාණය | බිලී කොකු සංඛ්‍යාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

3. ඉලක්කගත මත්ස්‍ය විශේෂ : ................................................................

4. ධීවර මෙහෙයුම් සඳහා වන කොන්දේසි : ................................................................

5. බලපත්‍රය සඳහා වන ඉල්ලුම්පත්‍රය අනුමත නොකරන්නේ නම් ඊට හේතු
..............................................................................................................
..............................................................................................................

...............................................
අධ්‍යක්ෂ ජනරාල්/සහකාර අධ්‍යක්ෂගේ අත්සන

නම : ..................................................................

තනතුර : ..................................................................

දිස්ත්‍රික්කය : .................................................................. දිනය : ..............................................

3(1), (3) නියෝග

**III උපලේඛනය**

මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර ගාස්තු

1. දිග මීටර් විසිහතර (24) කට වැඩි බෝට්ටු - රුපියල් ලක්ෂ පහක් (රු. 500,000/-)
2. දිග මීටර් පහලොව (15) සිට විසිහතර (24) දක්වා වන බෝට්ටු - රුපියල් පනස් දහසක් (රු. 50,000/-)
3. දිග මීටර් දහයයි දශම තුන (10.3) සිට පහලොව (15) දක්වා වන බෝට්ටු - රුපියල් පහලොස් දහසක් (රු. 15,000/-)

3(2) වන නියෝගය

**IV උපලේඛනය**

***ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව***

කොළඹ, ශ්‍රී ලංකාව.

ටෙලි/ෆැක්ස් අංක + 94112449170

email : depfishfisheries.gov.lk

*මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා වන බලපත්‍රය*

2013 අංක 1 දරන අංක 35 දරන පනත මගින් සංශෝධිත 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ බලාත්මක වන 2014 මහ මුහුදේ ධීවර මෙහෙයුම් නියෝගවල විධිවිධාන සහ 1982 එක්සත් ජාතීන්ගේ සාගර නීති සම්මුතිය, 1995 එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය තොග ගිවිසුම, ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභා ගිවිසුමේ හා 2009 නීති විරෝධී වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැලැක්වීමට, නතර කිරීමට සහ පිටු දැකීමට වරාය සහිත රාජ්‍යයන්වල පියවර පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධාන (FAO) ගිවිසුම යටතේ පිළිගත් සහ ශ්‍රී ලංකාව බැඳී සිටින්නා වූ සංරක්ෂණ සහ කළමනාකරණ පියවරවල් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව ...................... සිට ............................ දක්වා මහ මුහුදේ ධීවර මෙහෙයුම් වල යෙදීම සඳහා මයා/මියට මෙයින් බලපත්‍රයක් ලබා දෙනු ලැබේ. (කරුණාකර කොන්දේසි සඳහා බලපත්‍රයේ පසු පිට බලන්න.)

1. බලපත්‍රය නිකුත් කරනු ලැබූ බෝට්ටුවේ ලියාපදිංචි අංකය : ................................................

2. ධීවර බෝට්ටුවේ දිග : ................................................

3. බලපත්‍රය යටතේ අවසර දෙන ධීවර මෙහෙයුම් : ................................................

| භාවිතයට අවසර ලත් ධීවර ආම්පන්න | ධීවර දැලේ දිග හා දැල් ඇස් ප්‍රමාණය (උපරිම දිග කි.මී. 2.5 විය යුතුය) | බිලී කොකු සංඛ්‍යාව පාවෙන දැලේ දිග හා ශාඛාවල දිග | අවසර ලැබූ මත්ස්‍ය විශේෂ | මහ මුහුදේ මසුන් අල්ලනු ලබන ප්‍රදේශ |
|---|---|---|---|---|
| | | | | |
| | | | | වෙනත් වෙරළබඩ රාජ්‍යයක අනන්‍ය ආර්ථික කලාපයෙන් පිටත ඉන්දියන් සාගරයේ මහ මුහුදේ |

4. මසුන් ගොඩබානු ලබන දේශීය වරාය : ................................................

5. මසුන් අල්ලනු ලබන කාල සීමාව : ................................................

මුහුදු ක්ෂීරපායින්, කැස්බෑවුන්, කස මෝරුන්, මුහුදු පක්ෂීන් විශේෂ ඇල්ලීම, සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය හා ප්‍රතිනැව්ගත කිරීම සම්පූර්ණයෙන් ම තහනම් වේ. මහ මුහුදේ ස්ථාපනය කොට ඇති දත්ත බෝයාව (data buoys) සිට අරය කි.මී. එකක් ඇතුලත ප්‍රදේශයේ ධීවර මෙහෙයුම් සිදු නොකළ යුතු ය.

...........................................................
අධ්‍යක්ෂ ජනරාල්/බලපත්‍ර දීමේ නිලධාරී

දිනය : ................................................

09 - 533

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.